සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී,
(PB 62 PQ)
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

**කොටස්හිමියන් සඳහා වූ චක්‍රලේඛය**

හිතවත් කොටස්හිමියනි,

**වාර්ෂික වාර්තාව - 2024**

කොළඹ කොටස් හුවමාරු වෙළඳපොල මගින් නිකුත් කර ඇති ලැයිස්තුගත කිරීමේ රීතීන්ට අනුව සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි ("SDB" හෝ "බැංකුව") වාර්ෂික වාර්තාව පහත වෙබ් අඩවි මගින් ලබා ගත හැක.

**බැංකුවේ නිල වෙබ් අඩවිය** - https://www.sdb.lk/en/investor-relations/annual-reports (**ආයෝජන සබඳතා-වාර්ෂික වාර්තා)**

**කොළඹ කොටස් වෙළඳපොල වෙබ් අඩවිය** - https://www.cse.lk/home/company-info/SDB.N0000/financial.

ඒ අනුව මෙම වසරේ වාර්ෂික වාර්තාව ඇතුලත් CD තැටි නිකුත් නොකරන බව කරුණාවෙන් සලකන්න.

කොළඹ කොටස් වෙළඳපොල ලැයිස්තුගත කිරීමේ රීතීන්ගේ (සංශෝධිත) 7.5 වගන්තිය අනුව, ඔබට වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් අවශ්‍ය වේ නම්, ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරන්න. ඒ සඳහා ඔබ විසින් මෙයට අමුණා ඇති "ඉල්ලුම් පත්‍රිකාව" නිසි පරිදි සම්පූර්ණ කර ඉදිරිපත් කල යුතු අතර එකී ඉල්ලුම් පත්‍රිකාව අප වෙත ලැබී වෙළඳපොල දින අටක (08) කාලයක් තුල වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් එවීමට කටයුතු කරනු ලැබේ.

තවද, අප විසින් දෙන ලද ඉහත සඳහන් සබැඳින් (link) වෙත ප්‍රවේශ වීමට ඔබට අපහසු වන්නේ නම් හෝ මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඔබට යම් ගැටළුවක් වේනම්, සතියේ වැඩ කරන දින වල පෙ.ව.10.00 සිට ප.ව 4.00 දක්වා එම ගැටළු පහත සඳහන් නිලධාරීන් වෙත ඉදිරිපත් කල හැක.

| **නම** | **දුරකථන අංක** | **විද්‍යුත් තැපැල් ලිපිනය** |
|---|---|---|
| ෆියෝනා පෙරේරා මෙනෙවිය | 0112-832591 | sdbagm@sdb.lk |
| උචිත අනුහස් මහතා | 0112-832625 | sdbagm@sdb.lk |
| දමිත ගීගනගේ මහතා | 0112-832625 | sdbagm@sdb.lk |

ඔබ බැංකුවේ කොටස්හිමියකු වන්නේ නම් හා ඔබට රැස්වීම් කැඳවීමේ නිවේදනය හා ප්‍රතියුක්තකයකු පත් කිරීමේ සාධනපත්‍රය ලැබීමෙන් පසු එකී වාර්ෂික මහා සභා රැස්වීමට සහභාගී වීමට නොහැකි වන්නේ නම් , නිසි පරිදි සම්පූර්ණ කරන ලද ප්‍රතියුක්තකයකු පත් කිරීමේ සාධනපත්‍රය මෙම රැස්වීම පැවැත්වීමට නියම කර ඇති වේලාවට පැය 48 කට පෙරාතුව අප වෙත ලැබීමට සලස්වන මෙන් ඉල්ලා සිටිමි. මෙම වාර්ෂික මහා සභා රැස්වීම අතත්‍යව (Virtual / Zoom Meeting Platform) පැවැත්වීමට තීරණය කර ඇති අතර, ඊට අදාලව කොටස්කරුවන් වෙත සිදු කරනු ලබන අනෙකුත් නිවේදනයන් කොළඹ කොටස් වෙළඳපොල හා / හෝ ඉහත විස්තර කරන ලද බැංකුවේ වෙබ් අඩවිය මගින් සිදු කරනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි**
සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී

අමිලා බෙල්පාමුල්ල
සමාගම් ලේකම්

2025 ක් වූ මැයි මස 02 දින දීය

## සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී (PB 62 PQ)

## 28 වන වාර්ෂික මහා සභා රැස්වීම පිලිබඳ නිවේදනය

පහත සඳහන් අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි ("SDB" හෝ "බැංකුව") 28 වන වාර්ෂික මහා සභා රැස්වීම වර්ෂ 2025 ක් වූ මැයි මස 30 වන දින පෙ.ව. 10.00 ට, කොළඹ 06, කිරුළපන ,එඩ්මන්ටන් පාර, නො.12 දරණ ස්ථානයේ පිහිටි සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි "අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේ දී" අතත්‍ය රැස්වීමක් වශයෙන් (Online Virtual Meeting) පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. 2024 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ලාභලාභ ගිණුම, ශේෂ පත්‍රය හා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව සම්මත කිරීම.
2. පහත සඳහන් යෝජිත අධ්‍යක්ෂවරුන් දෙදෙනා නැවත පත් කිරීම.
   - සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 28 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස සණස මහා සංගමය නියෝජනය කරනු ලබන සරත් නන්දසිරි මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.
   - සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 28 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන රොමානි ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම.
3. 2025 වර්ෂය සඳහා විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී ආයතනය තෝරා ගැනීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.
4. 2025 වර්ෂය සඳහා ප්‍රදානයන් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම.

**28 වන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වන ආකාරය :**

1. 28 වන වාර්ෂික මහා සභා රැස්වීම බැංකුවේ සාංගමික ව්‍යවස්ථාවලියට හා කොළඹ කොටස් හුවමාරුව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ වලට අනුකූලව හා අදාළ නීති වලට යටත්ව අතත්‍ය රැස්වීමක් වශයෙන් පවත්වනු ලැබේ.
2. බැංකුවේ සභාපතිතුමිය, අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින්, ප්‍රධාන විධායක නිලධාරී, සමාගම් ලේකම් සහ බැංකුවේ අනෙකුත් නියෝජිතයන් හා එකී රැස්වීම පවත්වාගෙන යාමට, කටයුතු සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය වන පුද්ගලයින් ඉහත සඳහන් කල රැස්වීම පැවැත්වීමට නියමිත ස්ථානයට රැස් වේ. කොටස්හිමියන් ඇතුළු අනෙකුත් සියළු දෙනාම සූම් ක්‍රමය (ZOOM Meeting Platform) හරහා රැස්වීමට සහභාගී විය හැකි අතර, ඒ සඳහා අනුගමනය කල යුතු පියවර පහත පරිදි වේ. ;

   අ) මෙම අතත්‍ය වාර්ෂික මහා සභා රැස්වීමට උනන්දුවක් ඇති සියලුම කොටස්කරුවන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද පෝරම අංක 1 (Form 1) බැංකුවේ ලියාපදිංචි කාර්යාලයේ සිටින සමාගම් ලේකම් වෙත තැපැල් මගින්, අතින් භාරදීම මගින්, විද්‍යුත් තැපැල් (sdbagm@sdb.lk) මගින් හෝ 0112-514256 යන අංකය වෙත ෆැක්ස් පණිවිඩයක්, රැස්වීම පැවැත්වීමට පැය 48 කට නොඅඩු කාලයකට පෙර එවිය යුතු අතර, එමගින් අදාළ රැස්වීමට අතත්‍ය ලෙස සහභාගී වීමට අවශ්‍ය වන්නා වූ තොරතුරු (login Information) ඔබ වෙත ලබා දීමට බැංකුවට හැකියාව ලැබේ.

   ආ) රැස්වීමට සහභාගී වන සියලුම කොටස්කරුවන් රැස්වීම ආරම්භ වීමට පෙරාතුව මාර්ගගත ආකාරයෙන් (online) පූර්ව ලියාපදිංචි වීම සිදු කල යුතු අතර, ඉන් ඔවුනට රැස්වීමට සහභාගී වීම සඳහා අවසර ලැබේ. එවැනි අවස්ථා වලදී පෝරම අංක 1 (Form 1) මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු, මාර්ගගත ලෙස පූර්ව ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන තොරතුරු හා සමාන වන බවට කොටස්කරුවන් වගබලා ගත යුතුය.

3. රැස්වීමට සහභාගී වන කොටස්හිමියන් වාර්ෂික මහා සභා රැස්වීමේදී යම් විමසීමක් කිරීමට අදහස් කරන්නේ නම්, සභාපතිතුමිය විසින් කොටස්හිමියන්ගේ විමසීම් සඳහා වෙන් කරන ලද කාලයේදී තමාව හඳුන්වා දී එකී විමසීම් සිදු කල හැකිය. එහිදී තමා කොටස්හිමියෙකුද එසේ නොමැති නම් ප්‍රතියුක්තකයෙකු දැයි හඳුනා ගැනීම පහසු කිරීම පිණිස තම නම හා ලිපිනය ඔහු / ඇය විසින් ඉදිරිපත් කල යුතුය.

4. කොටස්කරුවන් හට තමන්ට ඇති ගැටළු බැංකුවේ ලියාපදිංචි කාර්යාලයේ සිටින සමාගම් ලේකම් වෙත තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් මාර්ගයෙන් (sdbagm@sdb.lk) හෝ අංක 0112-514256 වෙත ෆැක්ස් පණිවිඩයක් එවීම මගින්, රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙරාතුව ඉදිරිපත් කල හැකි අතර ඒවා සැලකිය යුතු කරුණු යැයි සභාපතිතුමිය සලකන්නේ නම් සාකච්ඡාවට භාජනය වේ.

5. යම් කොටස්හිමියකුට රැස්වීමට සහභාගි වීමට නොහැකි නම්, "ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රයේ" සඳහන් යෝජනාවන් සඳහා මනාපය පැහැදිළිව සටහන් කර **ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය** නිසි පරිදි පුරවා, තමා වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු පත් කිරීම සඳහා කොටස්හිමියන් උනන්දු කරන අතර, එවන් අවස්ථාවකදී එම කොටස්කරු රැස්වීම සඳහා සහභාගී නොවුනද එකී කොටස්හිමියාගේ ඡන්දය එකී රැස්වීමට සහභාගී වූ අයෙකුගේ ඡන්දයක් ලෙස සලකනු ලැබේ.
නිසි පරිදි පුරවන ලද ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය (දී ඇති උපදෙස් අනුව) රැස්වීම පැවැත්වීමට නියමිත වේලාවට පැය 48 කට පෙරාතුව සමාගම් ලේකම් වෙත එවීමෙන් ඔබගේ ප්‍රතියුක්තකයාට ඔබව නියෝජනය කිරීමේ හැකියාව මෙන්ම මහා සභා රැස්වීමේදී ඔබගේ උපදෙස් පරිදි ඡන්දය ලබා දීමට හැකියාව ඇත.

**මෙම රැස්වීම පැවැත්වෙන්නේ අතත්‍ය ක්‍රමයට බැවින්, සියළු කොටස්හිමියන් ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධන පත්‍රය, පෝරම අංක 1 සමඟ රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙරාතුව එවීමෙන් රැස්වීම කාර්යක්ෂමව පැවැත්වීමට හැකියාව ලැබේ.**

6. වර්තමානයේ රට තුල පැවතිය හැකි ඕනෑම තත්වයකදී වුවද, සැලසුම් කළ පරිදි මෙම රැස්වීම පැවැත්වීමට, බැංකුව අදිටන් කරගෙන සිටී. බැංකුවේ කොටස්හිමියන් වෙත තවදුරටත් දැන්වීම් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් ඒවා, කොළඹ කොටස් හුවමාරුවේ වෙබ් පිටුව www.cse.lk සහ / හෝ බැංකුවේ වෙබ් පිටුව https://www.sdb.lk/en/ මගින් සිදු වේ.

7. මෙම අතත්‍ය රැස්වීමට අවතීර්ණ වීමේදී/සහභාගී වීමේ දී යම් තාක්ෂණික ගැටළුවක් මතු වුවහොත් 0112- 832591 / 0112-832625 දරණ දුරකථන අංකය ඔස්සේ සමාගම් ලේකම් දෙපාර්තමේන්තුවට ඒ බව දැනුම් දිය හැක.

* මෙම අතත්‍ය රැස්වීමට සම්බන්ධ විය හැකි තොරතුරු සපයනු ලබන්නේ එක් එක් කොටස්හිමියන්ගේ / ප්‍රතියුක්තකයන්ගේ සහ සමාගම් / ආයතනමය කොටස්හිමියන්ගේ බලයලත් නියෝජිතයින්ගේ භාවිතය සඳහා පමණි. එකී අතත්‍ය රැස්වීම් සම්බන්ධතා තොරතුරු අවභාවිතාවක් සිදු වුවහොත් බැංකුව ඒ පිළිබඳ කිසිදු වගකීමක් දරනු නොලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි**

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී

අම්ලා බෙල්පාමුල්ල
සමාගම් ලේකම්

2025 ක් වූ මැයි මස 02 දින දීය.

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

**28 වන වාර්ෂික මහා සභා රැස්වීම**

## ප්‍රතියුක්තකයෙකු පත් කිරීමේ සාධනපත්‍රය

1. කොටස්හිමියාගේ සම්පූර්ණ නම .........................................................................................................................

2. සමාගමේ ලියාපදිංචි අංකය / සණස සමිතියෙහි ලියාපදිංචි අංකය / කොටස්හිමියාගේ ජාතික හැඳුනුම්පත් අංකය ..........................................................................................................................................

3. කොටස්හිමියාගේ ලිපිනය
   ..................................................................................................................................................

4. සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) සහභාගි වීමට ;

   විද්‍යුත් තැපැල් ලිපිනය හා ජංගම දුරකථන අංකය
   ..................................................................................................................................................

   සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි කොටස්හිමියෙකු ලෙස මෙයින් පත් කර සිටින්නේ ,

5. ප්‍රතියුක්තකයාගේ නම
   ..................................................................................................................................................

6. ප්‍රතියුක්තකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය
   ..................................................................................................................................................

7. ප්‍රතියුක්තකයාගේ ලිපිනය
   ..................................................................................................................................................

8. සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) සහභාගි වීමට ;

   විද්‍යුත් තැපැල් ලිපිනය සහ ජංගම දුරකථන අංකය
   ..................................................................................................................................................

ඔහු / ඇය සහභාගි වීමට අපොහොසත් වුවහොත්, සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සභාපතිනි දිනිති රත්නායක මහත්මිය, හෝ ඇය අපොහොසත් වුවහොත් විධායක අධ්‍යක්ෂ/ ප්‍රධාන විධායක නිලධාරී කපිල ආරියරත්න මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ චාමින්ද කුමාරසිරි මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ ප්‍රසන්න ප්‍රේමරත්න මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ බී.ආර්.ඒ.බණ්ඩාර මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ තුසන්ත විජේමාන්න මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ සරත් නන්දසිරි මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ කොන්රඩ් ඩයස් මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ නවීන්ද්‍ර සූරියාරච්චි මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ රොමානි ද සිල්වා මහතා, හෝ ඔහු අපොහොසත් වුවහොත් අධ්‍යක්ෂ චන්දන දිසානායක මහතා 2025 ක් වූ මැයි මස 30 වන දින කොළඹ 06, කිරුළපන, එඩ්මන්ටන් පාර, නො 12, දරණ ස්ථානයේ පිහිටි සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි "අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී" පෙ.ව. 10.00 ට පැවැත්වෙන සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි 28 වන වාර්ෂික මහා සභා රැස්වීමේ සහ ඊට අදාළව කල් තැබීමකදී සහ එයට ආනුශංගිකව පැවැත්විය හැකි ඡන්ද විමසීමකදී අප / මා වෙනුවෙන් ඡන්දය දීම සහ කතා කිරීම පිණිස අපගේ / මාගේ ප්‍රතියුක්තකයා වශයෙන් පත් කරමි / කරමු :

**පහත එක් එක් යෝජනා සම්මතය ඉදිරියේ "X" ලකුණ යොදා ඔබගේ මනාපය සලකුණු කරන්න.**

| | පක්ෂ | විපක්ෂ |
|---|---|---|
| **<u>යෝජනා අංක 1</u>**<br>2024 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා ලාභලාභ ගිණුම, ශේෂ පත්‍රය හා අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව හා විගණකවරුන්ගේ වාර්තාව සම්මත කිරීම. | ☐ | ☐ |
| **<u>යෝජනා අංක 2</u>**<br>සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 28 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන සී/ස සණස මහා සංගමය නියෝජනය කරනු ලබන සරත් නන්දසිරි මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම. | ☐ | ☐ |
| **<u>යෝජනා අංක 3</u>**<br>සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි සාංගමික ව්‍යවස්ථාවේ 6(4)(i) වගන්තිය ප්‍රකාරව කාර්ය මාරු ක්‍රමයට 28 වන වාර්ෂික මහා සභා රැස්වීමේදී විශ්‍රාම යන එලායන්ස් ෆිනෑන්ස් කම්පනි පී එල් සී නියෝජනය කරනු ලබන රොමානි ද සිල්වා මහතා අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත පත් කිරීම. | ☐ | ☐ |
| **<u>යෝජනා අංක 4</u>**<br>2025 වර්ෂය සඳහා විගණකවරුන් වශයෙන් අර්න්ස්ට් ඇන්ඩ් යන්ග් වරලත් ගණකාධිකාරී ආයතනය තෝරා ගැනීම හා ඔවුන්ගේ පාරිශ්‍රමිකයන් තීරණය කිරීම පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම. | ☐ | ☐ |
| **<u>යෝජනා අංක 5</u>**<br>2025 වර්ෂය සඳහා ප්‍රදානයන් සිදු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත බලය පැවරීම. | ☐ | ☐ |

**සමිති / සංගම් / ආයතන සඳහා**

නිල මුද්‍රාව

.......................................................
උප සභාපති / ලේකම්

.......................................................
සභාපති

.......................................................
දිනය

.......................................................
ප්‍රතියුක්තකයාගේ අත්සන

**පුද්ගලයන් සඳහා**

.......................................................
දිනය

.......................................................
අත්සන

.......................................................
ප්‍රතියුක්තකයාගේ අත්සන

**උපදෙස් :**

1. නියමිත පරිදි හිස්තැන් පුරවා මුද්‍රා තබා නිසිලෙස සාධන පත්‍රය සම්පූර්ණ කළ යුතු වේ.

2. සම්පූර්ණ කරන ලද මෙම සාධන පත්‍රය, 28 වන වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට නියමිත වෙලාවට පැය 48 කට පෙරාතුව පහත ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. එසේ නැතහොත් අදාල ඡන්දය වලංගු ඡන්දයක් සේ නොසැලකේ.

3. මෙම සාධන පත්‍රය පහතින්, බැංකුවේ ලිපිනය සඳහන් කර ඇති අතර එය නිසි පරිදි නවා තැපෑලෙන් අප වෙත නියමිත දිනට පෙර එවීමට කටයුතු කල යුතුය.

4. "ප්‍රතියුක්තකයෙකු පත් කරනු ලබන සාධන පත්‍රය" පත් කිරීම කරනු ලබන තැනැත්තා විසින් අත්සන් කර හෝ ඔහුගේ / ඇයගේ යථා පරිදි බලය පවරන ලද ඇටෝර්නි බලකරුගේ අත්සන යටතේ විය යුතු අතර එම පත් කරන්නා සංස්ථාවක් වන අවස්ථාවකදී එහි ඇටෝර්නි බලකරු හෝ යථා පරිදි බලයලත් තැනැත්තා විසින් අත්සන් කර පොදු මුද්‍රාව තබා ඉදිරිපත් කළ යුතු අතර, ප්‍රතියුක්තකයෙකු පත් කරනු ලබන සාධන පත්‍රය සමඟ බැංකුවේ ලියාපදිංචි කාර්යාලයෙහි තැන්පත් කරනු ලැබිය යුතුය.

- **ප්‍රතියුක්තකයෙකු පත්කිරීමේ සාධන පත්‍රය සමග නිසි පරිදි සම්පූර්ණ කරන ලද " පෝරම අංක 1" වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙර ඉදිරිපත් කලයුතුය.**

සමාගම් ලේකම්,
සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී,
අංක.12, එඩ්මන්ටන් පාර,
කිරුළපන,

කොළඹ 06.

**<u>පෝරම අංක 1</u>**

සූම් ක්‍රමය හරහා (Zoom Meeting Platform) රැස්වීමට සම්බන්ධවීම සඳහා කොටස්හිමියන් විසින් සම්පූර්ණ කල යුතුය.

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී**

**28 වන වාර්ෂික මහා සභා රැස්වීම - 2025 මැයි මස 30 වන දින**

<u>විද්‍යුත් තැපෑල /ෆැක්ස්/තැපැල් /අතින් භාරදීම මගින්</u>
සමාගම් ලේකම් වෙත,
සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

sdbagm@sdb.lk

| | | |
|---|---|---|
| කොටස්හිමියාගේ සම්පූර්ණ නම<br>(හවුල් කොටස්හිමියෙක් නම් <u>ප්‍රාථමික කොටස්හිමියාගේ</u> සම්පූර්ණ නම සඳහන් කරන්න). | | |
| ජාතික හැඳුනුම්පත් අංකය / සමාගම් ලියාපදිංචි කිරීමේ අංකය | | |
| දුරකථන අංකය | ජංගම | |
| | ස්ථාවර | |
| විද්‍යුත් තැපැල් ලිපිනය | | |
| | | |
| ප්‍රතියුක්තකයකු නම් කරන්නේ නම් *: | | |
| ප්‍රතියුක්තකයාගේ සම්පූර්ණ නම | | |
| ප්‍රතියුක්තකයාගේ ජාතික හැඳුනුම්පත් අංකය / විදෙස් ගමන් බලපත්‍ර අංකය | | |
| දුරකථන අංකය | ජංගම | |
| | ස්ථාවර | |
| විද්‍යුත් තැපැල් ලිපිනය | | |
| *** ප්‍රතියුක්තකයකු පත්කිරීමේ සාධන පත්‍රය ඇමිණිය යුතුය**. | | |

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි 28 වන වාර්ෂික මහා සභා රැස්වීමට පහත අත්සන් තබන අය හෝ මාගේ / අපගේ ප්‍රතියුක්තකයා අතත්‍ය ක්‍රමයෙන් සම්බන්ධ වනු ඇති බව මා විසින් / අප විසින් සහතික කරමි / කරමු. යම් හෙයකින් ප්‍රතියුක්තකයා පත් කරන්නේ නම්, යෝජනා සම්මතයට මාගේ / අපගේ ඡන්දය ලබා දෙන්නේ ප්‍රතියුක්තකයකු පත් කිරීමේ සාධන පත්‍රයේ දක්වා ඇති මනාපය පරිදි බව මම / අපි පිළිගනිමි / පිළිගනිමු.

.....................................................................

කොටස්හිමියා / කොටස්හිමියන්ගේ අත්සන

1. ආයතනමය කොටස්හිමියෙකු සම්බන්ධයෙන් නම්, මෙම ආකෘති පත්‍රය සම්පූර්ණ කල යුත්තේ එහි පොදු මුද්‍රාව (අදාළ වන්නේ නම්) හෝ සාංගමික ව්‍යවස්ථාවලියේ හෝ වෙනත් ආයතනික ලියකියවිලිවල දක්වා ඇති ආකාරයෙනි.

2. මෙම ආකෘති පත්‍රය ඇටෝර්නි බලපත්‍රලාභියෙකු විසින් අත්සන් කර ඇත්නම්, බැංකුවේ ලියාපදිංචි කර ඇති එකී ඇටෝර්නි බලපත්‍රය හෝ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු විසින් සහතික කරන ලද එකී ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් නිසි පරිදි අමුණා තිබිය යුතුය.

3. මෙම පෝරමය , රැස්වීම පැවැත්වීමට පැය 48 කට පෙරාතුව, සමාගම් ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතුය.

4. මෙම පෝරමය, විද්‍යුත් තැපැල මගින් (sdbagm@sdb.lk) හෝ ෆැක්ස් මගින් (0112-514256) හෝ වැඩ කරන දින වල පෙ.ව. 10.00 සිට ප.ව. 4.00 දක්වා කාලය තුළ ලැබීමට සැලැස්විය යුතුය.

5. ඔබට යම් ගැටළුවක් පැන නැගී ඇත්නම්, කරුණාකර 0112-832625 යන දුරකථන අංකයට අමතන්න.

## ඉල්ලුම් පත්‍රිකාව

වෙත : සමාගම් ලේකම්,

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී,

අංක 12, එඩ්මන්ටන් පාර, කිරුළපන,

කොළඹ 06.

**සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි 2024 වාර්ෂික වාර්ථාවේ මුද්‍රිත පිටපතක් ඉල්ලීම.**

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පී එල් සී හි 2024 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මූල්‍ය වසර සඳහා වූ වාර්ෂික වාර්තාවේ මුද්‍රිත පිටපතක් එවන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මාගේ / අපගේ විස්තර පහත සඳහන් වේ,

කොටස්හිමියාගේ සම්පූර්ණ නම : ............................................................................................................................................

කොටස්හිමියාගේ ජා.හැ.අ. / විදේශ ගමන් බලපත්‍ර අංකය / සමාගමේ ලි.ප අංකය : ......................................................

කොටස්හිමියාගේ ලෙජර් අංකය (කරුණාකර ලිපිනය සඳහන් කර ඇති ලේබලය බලන්න) :......................................

කොටස්හිමියාගේ ලිපිනය : ..................................................................................................................................................

දුරකථන අංකය:.......................................................................................................................................................................

..........................................................................  ....................................................

කොටස්හිමියාගේ / හිමියන්ගේ අත්සන  දිනය

**සටහන**

1. ඔබට මුද්‍රණය කල පිටපතක් අවශ්‍ය නම් කරුණාකර මෙම ඉල්ලුම් පත්‍රයට අදාළ තොරතුරු පුරවා සම්පූර්ණ කරන්න.

2. මෙම ඉල්ලුම් පත්‍රය ඇටෝර්නිවරයකු විසින් අත්සන් කර ඇත්නම් ඊට අදාළ හෝ ඒ හා බැඳෙන ඇටෝර්නි බලපත්‍රය මෙම ඉල්ලුම් පත්‍රය සමග අමුණා එවිය යුතුය.

3. කොටස්හිමියා සමාගමක් වන අවස්ථාවකදී ඉල්ලුම් පත්‍රය එම සමාගමෙහි පොදු නිල මුද්‍රාව යටතේ අත්සන් කොට හෝ එම සමාගමේ නිසි බලයලත් නිලධාරීවරයෙකු සමාගම් පනතට අනුව අත්සන් කර තිබිය යුතුය.